# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2466/07 - 2025 දෙසැම්බර් මස 08 වැනි සඳුදා - 2025.12.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

### පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ අංක 15 බමුණාවල කොට්ඨාසයට තේරී පත්වූ ගනේගොඩ අප්පුහාමිල්ලාගේ චමිලා ප්‍රසාදනී රත්නවර්ධන අයත් වන්නා වූ ජාතික ජන බලවේගය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30)ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සකු වී නොමැති අපේක්ෂකයකු, සභිකයකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ අංක 15, බමුණාවල කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා විජේකෝන් මුදියන්සේලාගේ මලීෂා නිශාධී රත්නායක නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි රත්නායක මුදියන්සේලාගේ හරේන්ද්‍ර බණ්ඩාර රත්නායක වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1) (අ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් විජේකෝන් මුදියන්සේලාගේ මලීෂා නිශාධී රත්නායක කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ අංක 15 බමුණාවල කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරාපත්කර ගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

**ආර්. එම්.එච්.බී. රත්නායක,**
තේරීම්භාර නිලධාරි,
කුරුණෑගල ප්‍රාදේශීය සභාව.

2025 දෙසැම්බර් මස 08 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කුරුණෑගල.

EOG 12 - 0038

1A - PG 7387 — 08 (2025/12)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*